# අධ්‍යාපන අමාත්‍යාංශය

# 9 ශ්‍රේණිය - 3 කොටස

# ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා

**මෙහෙයවීම -**

තාක්ෂණ ශාඛාව

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

එල්. එස්. කේ. වික්‍රමසිංහ මිය.

**සැලසුම් කිරීම සහ සකස් කිරීම -**

කේ. ඒ. ඩී. ප්‍රියානි ජයමැණිකේ මිය.

ගෘහ ආර්ථික විද්‍යා ගුරු උපදේශක

(කැලණිය අධ්‍යාපන කලාපය)

ආර්. එච්. ආර්. සඳමාලි පෙරේරා මිය.

(බප/කැල ශුද්ධවූ පවුලේ බා. වි.)

තාක්ෂණික ක්ෂේත්‍රය

# 4 ව්‍යාපාර

## 4.1 කුඩා ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා බලපාන සාධක හඳුනා ගනිමු

1.කුඩා ව්‍යාපාරයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

2.ව්‍යවසායකයන් කුඩා ව්‍යාපාර වෙත නැඹුරු වීමට හේතු ලියන්න.

3.කුඩා ව්‍යාපාර වර්ධනය වීම නිසා රටක ආර්ථික සංවර්ධනයට ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

4.ව්‍යාපාරයක් ආරම්භ කර එය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා බලපාන සාධක මොනවාද?

5. ව්‍යාපාර සාර්ථකත්වය කෙරෙහි බලපාන සාධක ලියන්න.

6.ව්‍යාපාරිකයෙකුට මුදල් අවශ්‍ය වන්නේ ඇයි?

7.භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට පෙර අවස්ථාවේ සිට පාරිභෝගිකයා අතට පත්වන අවස්ථාව තෙක්, රැස් කළ යුතු තොරතුරු මොනවාද?

8.කුඩා ව්‍යාපාරයක් සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ශක්තීන් මොනවා ද?

9. ව්‍යාපාරයක් දියුණු තත්ත්වයට පත් කර ගැනීමට ඇති අවස්ථා මොනවාද?

10.ව්‍යවසායකයකු යනු කවුරුන්ද?

11. ව්‍යවසායකත්ව පුද්ගලයින් නම් කරන්න.

12.සාර්ථක ව්‍යවසායකයකු සතු ලක්ෂණ ලියන්න.

13.සාර්ථක නායකත්ව ලක්ෂණ ලියන්න

14.ගැටළු විසඳීමේ ක්‍රියාවලිය ගැලීම් සටහනක් ඇසුරින් ලියන්න.

15.ඔබට ඇති විය හැකි ගැටළුවක් මූලික කර ගෙන එම ක්‍රියාවලිය ගැලීම් සටහනට ගලපන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර නිවැරදි කර ගන්න.

## 4.2 කුඩා ව්‍යාපාරයක් සාර්ථකව පවත්වා පසු විපරම් කරමු

1.කුඩා පරිමාණ ව්‍යාපාර කීපයක නම් ලියන්න.

2.වෙළඳපොළේ කීර්තිනාම දිනා ගත් මහා පරිමාණ ව්‍යාපාර කීපයක නම් දෙමව්පියන්ගෙන් අසා ලියන්න.

3.තරඟකාරී ලෙස වෙළඳපළ භාණ්ඩ ඉදිරිපත් කිරීමේදී ඒවා සතු විශේෂ ගුණාංග මොනවාද?

4.කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට වැදගත් වන ආයතන ලියා ඒවායින් ලබා දෙන සේවාව ලියන්න.

5.කුඩා පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා උදව් වන උපකාර සේවා නම් කරන්න.

6.ආදර්ශ මුදල් ලේඛනයක ආකෘතිය ඇසුරෙනි ඔබත් මුදල් ලේඛනයක් සැකසීමට උත්සාහ කරන්න.

7.ආදායම් ප්‍රකාශනයක අඩංගු මූලිකාංග මොනවාද?

8.ව්‍යාපාරයක මුදල් ආයෝජනය කළ හැකි විකල්ප මාර්ග මොනවාද?

1.පරිසරයට හිතකාමී ඇසුරුමක් කඩදාසි පල්ප ආශ්‍රයෙන් නිර්මාණය කරන්න.(පෙළ පොතේ ක්‍රියාකාරකම 2.5 උදාවී කර ගන්න)

2.සහල් පිටි වලින් සාදන රසකැවිලි නම් කරන්න.

3.සහල් පිටි වලින් සකසන උදෑසන ආහාර 3 ක් නම් කරන්න.

4.කොස් ඇට පිටි භාවිත කර සැකසිය හැකි ආහාර මොනවාද?

5.කොස් ඇට පිටි සකසන අයුරු ලියන්න.අත්හදා බලන්න.මවත් සමග එකතු වී කොස් ඇට පිටි සාදන්න.

දුවේ, පුතේ ඔබ කැමති නිර්මාණ එකතුවක් කරන්න. (අවමය පහයි) එය විධිමත්ව හැකි ආකාරයකට ගුරුතුමියට / ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

ආදරණීය දුවේ පුතේ ඔබේ හැකියා හඳුනා ගන්න, නිර්මාණශීලී වන්න. නව නිපැයුම් ගැන සිතන්න. ලෝකය දිනන්න අලුතින් සිතන්න. ලොව ජයගත් පුද්ගලයන් ගැන වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න. අන්තර්ජාල තොරතුරු ගවේෂණය කරන්න. වැඩදායි පුරවැසියකු වන්න උත්සහ ගන්න.

ගුරුභවතුන්ට උපදෙස් -

- දරුවන් අගය කිරීමට පෙළඹෙන්න.
- දරුවන්ගේ ඇඟයීම් වෙනුවෙන්, මෙම පාඩම් ආශ්‍රිතව, නිර්ණායක මත, ඇඟයුම් ක්‍රමවේද නිර්මාණය කර ගන්න.
- නිදහස් නිර්මාණවලට සිසු දරුවන් යොමු කර අවස්ථා පහක් ඇඟයීමට ලක් කරන්න.
- කාර්ය සාධන පත්‍රිකාව සඳහා ලබා දෙන ඇඟයීම් ලකුණු මේ වෙනුවෙන් පිරිනමන්න.